එය මුළුමණින්ම බානු. එසේ නැතිනම් එය මුළුමණින්ම අතහැර දමනු.

ඉබ්නු උමර් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- හිසකෙස් කොටසක් බා තවත් කොටසක් අතහැර දමා තිබූ දරුවකු දුටුහ. එවිට එතුමා ඔවුන් එයින් වළක්වා : "එය මුළුමණින්ම බානු. එසේ නැතිනම් එය මුළුමණින්ම අතහැර දමනු." යැයි පවසා සිටියහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත]

හදීසයේ තේරුම: අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- හිසකෙස් කොටසක් බා තවත් කොටසක් අතහැර දමා තිබූ දරුවකු දුටුහ. එවිට එතුමා දෙවන වරට එසේ සිදු නොකරන මෙන් ඔවුන් වළක්වා : "එයින් කොටසක් බා කොටසක් අතහැර නොදමනු" යැයි පවසා සිටියහ.

http://www.sunnah.global/hadeeth/si/show/8906